
# සුලභත්වය හා දුර්ලභත්වය අතර ගමන් කරන අන්දිස් වැසියන් සහ බටහිර ආර්ථිකය

අන්දිස් කඳු වැටිය යනු ආජන්ටිනාව, බොලිවියාව, චිලිය, කොලොම්බියාව, ඉකුවදෝරය, පේරු රාජ්‍යය හා වෙනිසියුලාව යන රටවල් හත පුරා පැතිරී ඇති ආසියාවෙන් බැහැරව පිහිටි උස්ම ගිරි මුදුන් සහිත කඳු වැටියයි. බිමෙහි පිහිටීමෙහි අසමාකාර ස්වභාවය කුණාටු හා හිම තුහිත ආදිය සළකන විට අන්දිස් කඳුකරයෙහි ඇත්තේ කෘෂිකර්මයට පිටුබලයක් වන පසු බිමක් නොවේ. එසේම නවීන පහසුකම් බොහෝ අඩු එහි ජීවිතය දුෂ්කරය. එසේ නම් සිය වගාව හානිවූ අන්දිස් කඳුකර වාසී ගොවියෙකුගේ හෙට දවස ගැන ඔබ සිතන්නේ කුමක්ද? බංකොලොත්භාවයට පැමිණ සිය ගම් බිම් අත්හැර දැමීමට හෝ නිරාහාරයේ මිය යාමට හෝ ඔහුට සිදු වනු ඇත්ද? නැත. සෙසු ගොවීන්ගේ වගා බිම් වල මෙහෙවරක් ඉටු කරමින් ඔහු සිය ජීවිකාව ආත්ම ගෞරවයත් රැක ගනු ඇත.

එහෙත්...., යටත් විජිත යුගයේදී පවා දකුණු ඇමරිකාවේ වැදගත්ම නගරය ලෙස විරුදාවලිලත් පේරු රාජ්‍යයේ වෙරළාසන්න අග නගරය වන හැම අතින්ම පොහොසත් ලිමා නගරයේ වෙසෙන වැදගත් නාගරිකයකු ගැන සිතන්න. සිය හාම්පුතා විසින් හදිස්සියේ සේවයෙන් පහ කරනු ලැබුවහොත් ඔහුට සිදු වන්නේ කුමක්ද? ජීවන වියදම් පියවා ගැනීමට ගේ දොර උකසට තැබීමටත් ආත්ම ගෞරවය පසෙකලා බසයක රසකැවිලි විකිණීම වැනි සුළු රැකියාවක් කිරීමටත් ඔහුට සිදු වනු ඇත.

පළමුව දැක්වුනු අන්දිස් කඳුකර ගොවියා හැම විටම සුරක්ෂිතය. ජීවිකාව පිරිහි විටෙක අමාරු අඩියට වැටුනද, තමන් අයත් සමාජයේ අනෙකුත් සාමාජිකයන්ගේ ද දේශිය " ක්වේචුවා (Quechua) " බසින් සොබාදම් මාතාව යන අරුතැති " පචාමමා " ලෙස හැඳින්වෙන ස්වභාවධර්මයේද උදව්වෙන් නැවත නැඟී සිටීමට ඔහුට අවස්ථාව ලැබේ.




දෙවනුව දැක්වුනු නාගරිකයාගේ රැකියාව නැතිවීම ඔහුගේ අවසානයයි. එම නාගරිකයා අර්ථ දැක්වීම තුල මෙන්ම ප්‍රායෝගික යෙදවුම් තුලදීද සම්පත් වල සීමිතභාවය හා හිඟකම මත ගොඩ නැඟුනු දුලබතා ආර්ථිකයෙහි ගිලුනු හුදෙකලා පුද්ගලයෙකු පමණක් වීම ඊට හේතුවයි.

මෙම තත්ත්වයන් එකිනෙකට වෙනස් එහෙත් පරස්පර විරෝධී නොවන ආර්ථික න්‍යායයන් දෙකක ප්‍රතිඵලයි. පළමුවැන්න වන අන්දිස් ආර්ථික න්‍යාය ජීවය පෝෂණය කිරීමේ ක්‍රියාවලිය " ලෙස හැඳින්වෙන අතර දෙවැන්න " වෙළඳපල සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය " හෙවත් නව බටහිර ආර්ථික න්‍යායයි.

ස්පාඤ්ඤ යටත් විජිත වාදීන් මෙම පෙදෙසට පැමිණි 1532 තරම් ඈත කාලයේ සිටම මෙම ආර්ථික න්‍යායයන් දෙකම මෙම පෙදෙසේ යෙදවී තිබේ. යටත් විජිත යුගය ආරම්භයේදී වඩාත් සෞභාග්‍යමත් දේශීය සංස්කෘතීන් පැවතියේ උතුරු ඇමරිකාවේ නොව මධ්‍යම හා දකුණු ඇමෙරිකාවෙහිය. අන්දිස් කඳුකර කලාපයට ආ යුරෝපියයන්ගේ ආර්ථික න්‍යායන්ට හෝ තාක්ෂණයන්ට ඔවුන් අපේක්ෂා කළ අන්දමට එම පෙදෙසට සමෘද්ධිය උදා කරන්නට නොහැකි විය. මේ අතර තුර එම ආර්ථික න්‍යාය භාවිතයෙන් උතුරු ඇමරිකාව ආර්ථිකය අතින් ලොව තුල ඉමහත් බලසම්පන්නභාවයකට හේතුව කුමක් විද?


උතුරු ඇමරිකානු කලාපය හා දකුණු ඇමරිකානු කලාපය අතර ප්‍රබලම වෙනස ඇත්තේ ඒවායේ පිහිටුමෙහි සහ දේශගුණයෙහිය. අන්දිස් කඳුකරය ආශ්‍රිත දකුණු ඇමරිකාව උස කඳු මුදුන් සහ එකිනෙකට වෙනස් දේශගුණ තත්ත්වයන් පෙළක් සහිතව නිවර්තන කලාපයේ පිහිටා ඇත. ලෝකයේ ඇති දේශගුණ තත්ත්ව වලින් 85% ක් සාපේක්ෂව කුඩා පෙදෙසක් වන මෙම පෙදෙසෙහි සංකේන්ද්‍රණය වී තිබේ. මේ හේතුවෙන් මෙම කලාපය සුවිශාල ජෛව විවිධත්වයකින් සමන්විත වන අතර අන්දිස් පෙදෙසට ආවේණික සුළු වගා ක්‍රමය ( Small farming system ) පදනම් වී ඇත්තේ ද ඒ මතය. උතුරු ඇමරිකාව තැනිතලා බිම් හා බොහෝ කොටම සමාන දේශගුණ තත්වයන්ගෙන් යුක්තව සෞම්‍ය කලාපයේ පිහිටා ඇත. මෙම ලක්ෂණ මහා පරිමාණ තනි බෝග නිෂ්පාදන ක්‍රියාවලින් බෙහෙවින් හිතකර ලෙස බලපා ඇත. උතුරු ඇමරිකාවේ සාර්ථක වූ බටහිර ආර්ථික න්‍යායයන් අන්දිස් පෙදෙස තුලදී අසාර්ථක වීමට හේතුවද ඉන් පැහැදිලි වේ. දකුණු ඇමරිකාවේ භෞතික පාරිසරික තත්ත්වය අනුව මෙම ඉල්ලුම් සැපයුම් න්‍යාය නොගැලපුනු අතර එම පෙදෙස් තුල මිනිසාගේ පැවැත්ම තහවුරු කර ගැනිම සඳහා අවශ්‍ය වූ සමාජ සංස්කෘතික සබඳතා ශක්තිමත් කිරීමට ඒවා තුල කිසිඳු ශක්තියක් නොතිබුනි. අනෙක් අතට සමාජීය හා පාරිසරික සබඳතා වලදී මිනිස් චරියාවන්ට කිසියම් ප්‍රචණ්ඩකාරී බවක් එක්වීම මෙම ආර්ථික න්‍යායන්ගෙන් සිදුවිය. සමාජයක් ලෙස සෞභාග්‍යමත් වීමට නම් අන්දිස් පෙදෙසේ ජනතාව “ද්‍රව්‍යමය භාණ්ඩ” හා “භෞතික භාණ්ඩ” මත පදනම් වූ බටහිර ආර්ථික විද්‍යාව යළි විමර්ශනයට භාජනය කළ යුතුව තිබේ. අන්දිස් පෙදෙසේ වැසියන්ගේ පාරම්පරික දැක්ම වන “ප්‍රමාණවත් සුලභතාවය” පෙරටු කොට ගෙන සැම අයෙකුටම ප්‍රමාණවත් කොටසක් ලැබෙන පරිදි ආර්ථික වර්ධනය ඇති කෙරෙන “ආර්ථික සුලභතා” න්‍යාය මෙම කලාපයට වඩාත් ගැලපෙන සංකල්පය ලෙස හඳුනා ගැනෙමින් පවතී.

පාරම්පරික අන්දිස් ජනතාව තුල පවතින්නා වූ දාර්ශනිකත්වය සුලභත්වය පිළිබඳ වෙනස දැකිමටත් ඒ තුලින් ප්‍රමාණවත් ලෙස ජීවත්වීමටත් අවස්ථාවක් ලබාදීම මෙම ආර්ථික න්‍යායන් තුලදී අපේක්ෂා කරනමුත් බටහිර ආර්ථිකය තුලින් අසීමිත අවශ්‍යතා මිනිසා තුලට ඇතුල් කිරීමද දැකිය හැකිය. එනමුත් මෙම අසීමිත අවශ්‍යතා සඳහා පවතින සීමිත සම්පත් අභිබවා යමින් භාවිතා කිරීම නිසා සම්පත් ඌනතාවයක්ද ඇති වී ඇත. පෙරට වඩා ලාභය සඳහා භාණ්ඩ, ද්‍රව්‍ය සේවා නිෂ්පාදනය කරනු ද දැකිය හැකිය. තවද පෙරට වඩා නවීන විද්‍යා හා තාක්ෂණය හරහා පූර්ණ නිදහසක් ලබා ගැනිමට අපේක්ෂා කරන අතර ඉහල ලාභයක් උදෙසා උපරිම ලෙස බිම් භාවිතා කරනු දැකිය හැකියි.

බටහිර මිනිසුන් මිහිකත මවට සමාන කරයි. මෙම ගොවි ක්‍රමය භෞතික හා භෞතික නොවන දැනිම තත්ත්වය සහ සැපයුමත් අතර යාන්ත්‍රණය වේ. විශාල ආර්ථික ශක්තියක් තිබෙන රටවල ඉහත තත්ත්වය හඳුනාගැනිමට හැකි නමුත් අඩු සංවර්ධනයක් පවතින රටවල දේශපාලනය පසෙකලා ආර්ථික වර්ධනය ඉතිහාසය හරහා පැහැදිලි කරයි. එනමුත් සංවර්ධිත රටවල ආර්ථික වර්ධනයේදී ඉතිහාසය මඟ හැර යමින් කටයුතු කිරීම නිසා අඩු සංවර්ධිත රටවල් බවට පත්වී ඇත.

අන්දිස් ජාතිකයන් ( Runa ) රූනා වැනි කුඩා පරිණාම බටහිරකරණයට ලක් වූ ගොවින් හෝ වෙළඳුන්ගෙන් සැදුම්ලත සංස්කෘතීන් දෙකක විවිධ වූ අදහස් හා වැඩ මිනිසුන් හා එක්ව ගමන් කරයි. තවද පෝෂිත ජිවිතයක් සඳහා සාමුහිකත්වය හා එකිනෙකට බල පැවැත්වීම ඉතා වැදගත්වේ.

Runa වැසියන් Pachama හා දෙවියන් අතර අදහස් හුවමාරුවන තවත් බටහිරකරණයට ලක්වීමට පෙර අන්දිස් ජාතින් ඔවුන් ජිවත් වන වටපිටාවේ ආරක්ෂාව පිළිබඳව මුල්තැන දෙන ලදී. මෙහිදී සහජීවී සම්බන්ධතාවය ගොඩනංවන ලදී. රට අභ්‍යන්තරයේ අන්දිස් වාසින් බටහිර ආර්ථික පියවර පිළිනොගැනිම හේතුවෙන් දුප්පතුන් හා පොහොසතුන් අතර සමාජීය පාරිසරික ගැටුම් ඇතිවනු දැකිය හැකි අතර මේ තුලින් දිළිඳු කමින් තොරව ජිවත්වීමට අන්දිස් වාසින් අපේක්ෂා කරයි.



අන්දිස් වාසින්ගේ පෞරාණික ගොවිපලක පැවතිම හදුනාගත හැකිය. මෙහිදී ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර හමුවීමක් සිදුවේ. මෙම වෙළඳ ස්ථාන තුල වෙළඳුන් ගොවින් නගරයේ මිනිසුන් භාණ්ඩ විකිණීමට සහ මිලදී ගැනිමට පැමිණෙයි. මෙම දේශිය වෙළඳ පොළ ආර්ථිකය ශක්තිමත් කිරීමට උදව් දෙයි. මේ වන විට දහස් ගණනින් ඇන්ඩියානුවන් බටහිර පද්ධති උදව් කරගෙන ජිවිතයේ දියුණුව සිඳුකරයි.

උදා :- පිරූ සහ බොල්වියාව අතර ටිටිකා විල තිබෙන කලාපයේ ඉහල අස්වැන්නක් ඇති කර ගනියි.

මේ සඳහා තාක්ෂණික හා මූල්‍ය ධනය NGO වලින් ලබාදෙයි. අන්දිස් ගම්වැසියන්ගේ තාක්ෂණික ව්‍යුහය යටතේ අන්දිස් වාසින්ගේ සංස්කෘතිය සහ මානුෂික ප්‍රතිපත්ති ලිඛිතව ප්‍රකාශයට හා ප්‍රයෝජනයට ගත හැකය. මේ වැඩ සටහන් හරහා නවින විද්‍යාව හා ගම්වැසි දැනුම් පද්ධතිය හා ඔවුන්ගේම වෘත්තින්හි කාර්යක්ෂමතාව ලබා ගන්නා ලදි. සංස්කෘතිය වැඩි දියුණු කිරීම සම්බන්ධව කුඩා සංවිධාන එක්ව UNDP යටතේ ව්‍යාපෘතියක් දියත් කල අතර මෙහිදී අන්දිස් පාරම්පරික වගාවන් වැඩි දියුණු කිරීම සිදුකරන අතර ඒ සම්බන්ධවද සංවිධාන කිහිපයක් ද සම්භවය වී ඇත. මේ වන විට ප්‍රඥාව හා ලෝක දැක්ම මුල්කර ගනිමින් වත්මන් ආර්ථික අවස්ථාවන් ගැන සිතිමට හැකි වී ඇත.

*සොනාලි ගුණසිංහ*
*වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව*
*ඩී. මනෝජා ජයසේකර - පරිසර අමාත්‍යාංශය*